**ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - 2018**

**-----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ආයතනය සතු මෝටර් රථ ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.10,447,500 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. 2019 වර්ෂයේදී එම වාහන නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ඵලදායි ජීවිත කාලය තක්සේරු කර ගෙන ක්ෂය කිරීම් සිදු කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව සමූපකාර අරමුදලට ගෙවිය යුතු රු.24,000,000 ක ණය ශේෂය ජංගම නොවන හා ජංගම වගකීම් වශයෙන් වෙන් වෙන්ව හඳුනාගෙන ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී ගෙවීමට ඇස්තමේන්තුගත මුදල ජංගම වගකීම් යටතේ සටහන් කර ඉතිරිය ජංගම නොවන වගකීම් යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------- | ------------- |
| (අ) | ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේදී ගොඩනැගිලිවල සමුච්චිත ක්ෂය වටිනාකම රු.1,151,977 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිතය එම අගයෙන් වැඩියෙන් දැක්වුණි. | නිරීක්ෂණ නිවැරදි වේ. 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදනය රු.30,530,000 ක් වුවත්, ඉකුත් වර්ෂයේ ලැබී තිබුණු භාණ්ඩාගාර ප්‍රදාන වලින් ඉතිරිව තිබූ රු.543,744 ක් හා වෙනත් ගැලපිලි කර වර්ෂයේ ආදායම ලෙස රු.31,134,685 ක් කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රදාන රු.604,685 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.1,269,014 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත විස්තර දැක්වෙන එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.148,899,224 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | -------- | ------- | ----------------- | ------------------------ | -------------- |
| | | රු. | | | |
| (i) | යන්ත්‍ර උපකරණ | 103,064,255 | උපලේඛන | යන්ත්‍ර උපකරණ, ලීබඩු උපකරණ වාහනවලට අදාළ උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | වත්කම් ලේඛනගත කිරීමට නිර්දේශ කල යුතුය. |
| (ii) | ලී බඩු උපකරණ | 45,834,969 | | | |
| | | --------------- | | | |
| | | 148,899,224 | | | |
| | | ======== | | | |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ----------------------------- | ------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 7 ක එකතු වටිනාකම රු.5,939,694 ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක පැවති ශේෂ එකතුව රු.1,730,268 ක් හා වසර 5 ට වඩා වැඩි කාලයක් තිස්සේ ලැබිය යුතු ශේෂවල වටිනාකම රු.879,859 ක් විය. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය හැකි සෑම උත්සාහයක්ම ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ලැබිය යුතු මුදල් නිරවුල් කර ගැනීමට කළයුතුය. |
| (ii) | 2005 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වැට් බදු ශේෂය රු.33,933,319 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | මේ සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ අතර ආපසු ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කළයුතු ආකාරය පිළිබඳව වාචික උපදෙස් ලැබී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. | ශේෂ නිරවුල් කර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.98,001,141 ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක නිරවුල් නොකළ ශේෂ එකතුව රු.62,480,490 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවා නිරවුල් නොකළ ශේෂයන්හි එකතුව රු.34,365,853 ක් විය. | අවුරුදු 05 ක කාලයක් ඉක්මවූ ශේෂය රු.15,106,285 ක් ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ රැඳවුම් මුදල පමණි. මේ සම්බන්ධව දැනට කැබිනට් පත්‍රිකාවක් අමාත්‍යාංශ වෙත යොමු කර ඇති අතර එම කැබිනට් පත්‍රිකාවට ලැබෙන අනුමැතිය මත ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය | අර්ථසාධක අරමුදලට දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව පදනම් කර නොගෙන 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූලික වැටුප මත පමණක් සේවකයන්ගෙන් අයකර ගෙවීම් කර 2018 වර්ෂයේ හිඟ මුදල් ගණනය කර සේවකයාගේ දායක මුදල රු.1,673,929 ක්ද ආයතනයේ අධ්‍යයන හා පුහුණු ගිණුමෙන් ගෙවා තිබුණි. | 2019 මැයි මස 31 දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී සේවකයන් වෙනුවෙන් ආයතනය විසින් ගෙවන ලද මුදල නැවත අයකර ගැනීමට තීරණය කර ඇත. ඒ අනුව කටයුතු කරමි. | සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව සේවක දායකය අය කරගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 104(4) | 2014 ජුනි 01 දින අනතුරට ලක්වූ ආයතනය සතු මෝටර් රථයක් වර්ෂ 4 ක පමණ කාලයක් භාවිතයට නොගෙන කාර්යාල භූමියේ ස්වභාවික ආපදාවලට ලක්වෙමින් නිෂ්ක්‍රීයව පැවතුණු අතර, පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කමිටුවක් පත්කර අනතුර පිළිබඳව එම කමිටුවේ නිර්දේශ ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා 2019.05.31 දින පැවැති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණ කරනු ලැබීය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව නිර්දේශ කරමි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2013 හා 2014 වර්ෂවල දී රු.මිලියන 5 ක මුදලක්ද සමාලෝචිත වර්ෂයේදී මිලියන 10 ක මුදලක්ද ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ජංගම ගිණුමේ පවතින ශේෂයන් සඳහා පොළී ආදායමක් උපයා ගැනීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළ නමුත් මේ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමට නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,914,386 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,509,280 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.405,106 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම වැඩිවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------- |
| (අ) | බාහිර පාර්ශවයන් වෙත කුළියට දී ආදායම් ඉපයීමේ අරමුණින් 2014 වර්ෂයේදී රු.මිලියන 257 ක් වැය කර නරඹන්නන් 1127 ක ප්‍රමාණයක් සඳහා ඉඩ පහසුකම් ඇතිව හා ලොබි දෙකකින් සමන්විත ශ්‍රවනාගාරය 2018 වර්ෂයේදී ප්‍රයෝජනයට ගෙන තිබුණේ අවස්ථා 29 කදී පමණක් වන අතර, මෙම ශ්‍රවනාගාරය තුළ ආනයනික පුටු 160 කින් සමන්විත ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු පැවැත්වීමට හැකි සම්මන්ත්‍රණ ශාලා දෙක 2014 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | උපයෝජනය වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන අතර, ප්‍රධාන ලොබි 02 හා භෝජනාගාරය සහ සම්මන්ත්‍රණශාලා උපයෝජනය වර්ධනය කර ගැනීම සඳහා නෙළුම් පොකුණ රඟහල හා බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේ නිළධාරීන් ද ඇතුළත් වන පරිදි පත් කරන කමිටුවකින් නිර්දේශ ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | ආයතනය සතු බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම් මහල තුළ වර්ග අඩි 2979 ක් පමණ වූ පරිශ්‍රය තුළ පවත්වා ගෙන ගිය කෝප්සිටි ආදර්ශ වෙළඳසැල 2017 අගෝස්තු 25 දින ආයතනයට නැවත භාරදී තිබූ අතර, එම පරිශ්‍රය ඵලදායී කාර්යයකට යොදාගෙන නොතිබීමෙන් තක්සේරුව අනුව සමාලෝචිත වර්ෂයේදී රු.720,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | ආයතනයේ බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම් මහළ තුළ පවත්වාගෙන ගිය Co-op City ආදර්ශ වෙළඳසැල ඔවුන්ගේ අවශ්‍යතාවය මත එම ස්ථානයෙන් ඉවත් කරගත් අතර දැනට මෙම පරිශ්‍රය ආයතනයේ වෘත්තීය පාඨමාලා ඉගැන්වීමේ කටයුතු සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී විභාග කටයුතු සඳහා යොදා ගනී. | ගොඩනැගිලි උපයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුහුණු මාර්ගෝපදේශය තුළ ඉලක්කගත කර තිබූ පාඨමාලා 4 ක් ප්‍රවර්තන වර්ෂය තුළ නොපැවැත්වීම මත රු.927,500 ක ආදායමක් අහිමි වී තිබුණි. | ප්‍රමාණවත් ශිෂ්‍යය සංඛ්‍යාවක් නොමැති වීම මත මෙම පාඨමාලා පවත්වා නැත. | පුහුණු මාර්ගෝපදේශයේ සඳහන් ඉලක්කගත පාඨමාලා පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී රු.16,000,000 ක වියදමක් දරා සුඛෝපභෝගී ආකාරයට වැඩි දියුණු කළ ආයතනය සතු සංචාරක නිවාසය සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කර තිබුණේ අවස්ථා 29 කදී පමණි. | පුළුල් ප්‍රචාරණය හා ගාස්තු සංශෝධනය තුළින් වෙන් කර ගැනීමේ ප්‍රමාණය වැඩිකර ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | උපයෝජනයට වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී ආයතනයේ පුහුණු පාඨමාලාවල ප්‍රමිතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණ රු.6,000,000 කින් රු.2,623,316 ක මුදලක්ද, ශ්‍රවනාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවලදී ලැබුණු රු.68,445,000 ක මුදලින් වැය නොකළ රු.29,755,000 ක මුදලක්ද සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු මුදලින් රු.17,773,317 ක මුදලක්ද ජංගම ගිණුම තුළ රඳවාගෙන තිබුණි. | පාඨමාලාවල ප්‍රමිතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉතිරිව ඇති රු.මිලියන 2.6 ක මුදල 2019 වර්ෂයේ දී පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමටද, ශ්‍රවනාගාරයේ ගෙවීම් සඳහා කැබිනට් අනුමැතිය ලැබුණු පසු රු.මිලයන 27.55 ක මුදල සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතය රු.මිලියන 17.77 ක මුදලෙන් රජයේ නිවාස අලුත්වැඩියා වෙනුවෙන් අත්තිකාරම් මුදල් හා අතුරු බිල්පත් ගෙවීමට ද යොදා ගෙන ඇත. | අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ වාණිජ වටිනාකමින් යුක්ත ඉඩම් කොටසක පිහිටි පැරණි කාර්යාල ගොඩනැගිල්ල නිෂ්කාර්යව පවතින අතර මෙය අලුත්වැඩියා හෝ නව ඉදිකිරීමක් සිදුකර ප්‍රයෝජනයට ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණු අතර, මහවැලි ගොඩනැගිලි පරිශ්‍රය ලෙස හඳුන්වා ඇති ගොඩනැගිල්ලක් කිසිදු ප්රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ වූ විට මෙම පරිශ්‍රය ප්‍රයෝජනයට ගත යුතු වනවා ඇත. | ආයතනය සතු වත්කම් උපයෝජනය කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තනතුරු 06 කට බඳවා ගැනීම සඳහා අවස්ථා 3 කදී පුවත්පත් 9 ක දැන්වීම් පළකිරීමට රු.454,589 ක වියදමක් දරා තිබුණද කිසිදු බඳවා ගැනීමක් සිදු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ බඳවා ගැනීම සඳහා පළකර ඇත්තේ එක් පුවත්පත් දැන්වීමක් පමණි. අදාළ දැන්වීම සඳහා රු.192,220 ක මුදලක් වැයකර ඇති අතර එම දැන්වීම ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. | සැලසුම්සහගතව කටයුතු කර නිෂ්කාර්යය වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළමනාකරණ මණ්ඩල තීරණ අනුව කථිකාචාර්යවරයෙක් මාසයකට වැඩ කළ යුතු අවම පැය ගණන පැය 60 බැගින් කථිකාචාර්යවරු 4 දෙනා විසින් 2018 වර්ෂයේදී පවැත්විය යුතු මුළු දේශන පැය ගණන 2880 ක් විය යුතු වුවද, වර්ෂය තුළ පවත්වා තිබූ දේශන පැය ගණන 1904 ක් විය. ඒ අනුව වර්ෂය තුළ පැය 976 ක් අඩුවෙන් දේශන පවත්වා තිබුණි. | මාසික දේශන පැය 60 ආවරණය කිරීම සඳහා දේශකවරුන් දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | කළමනාකරණ මණ්ඩල තීරණ අනුව කටයුතු කළ යුතු බව නිර්දේශ කරමි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | 2018 වර්ෂයේදී දැනුවත්භාවයක් නොමැති වුවද 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එහි ක්‍රියාකාරකම් තුළින් තිරසාර සංවර්ධන අරමුණු 17 ඔස්සේ කවර අරමුණක් ආවරණය වන්නේ ද යන්න පිළිබිඹු වන ආකාරයට සකස් කිරීමට කටයුතු කර ඇත. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළයුතු බව නිර්දේශ කරමි. |